# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

## 2014 ජනවාරි 01 - 2014 දෙසැම්බර් 31

2 - CM 023187 — 100 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
කොළඹ 08.
2015.

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමා,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
අංක 163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

## වාර්ෂික වාර්තාව - 2014

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

01. 2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මණ්ඩලයෙන් ඉටු කෙරුණ කාර්යභාරය;

02. විගණකාධිපතිගේ වාර්තාව;

03. එම කාලපරිච්ඡේදය සඳහා අවසන් ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්.

මෙයට,
විශ්වාසී,

ජනාධිපති නීතිඥ, ඩබ්ලිව්. දයාරත්න,
සභාපති.



3 - CM 023187

# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – 2014 කෙටුම්පතකි

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**

1973 අංක 5 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ අපේක්ෂාව වූයේ**

(i) ශ්‍රී ලංකාවේ පුවත්පත්වල නිදහස ආරක්ෂා කිරීම
(ii) එම නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම වලක්වාලීම
(iii) සත්‍ය තොරතුරු දැන ගැනීමේ ජනතා අයිතිය තහවුරු කිරීමත් ය.

2012.01.01 දින සිට අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 ස්ථානයේ පවත්වාගෙන යනු ලැබීය.

**01. මණ්ඩලයේ සැකැස්ම**

අර්ධ අධිකරණමය කාර්ය භාරයක් ඉටු කරන පුවත්පත් මණ්ඩලය සාමාජිකයන් හත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (වර්තමානයේ අධ්‍යක්ෂ ජනරාල්) නිල බලයෙන් මණ්ඩලයේ සාමාජිකත්වය ලබයි. සාමාජිකයින් හයදෙනෙකු පත් කිරීම සිදු වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසිනි. ඉන් එක් තැනැත්තෙකු ක්‍රියාකාරි පත්‍ර කලාවේදීන් නියෝජනය කරන තැනැත්තෙකු විය යුතු අතර, තවත් සාමාජිකයෙකු පුවත්පත් ව්‍යාපාරයේ සේවකයන්ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තෙකුගෙන් සමන්විත වේ. පත් කරනු ලබන දින සිට සාමාජිකයන්ගේ නිල කාලය වසර 03 කි.

අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද මණ්ඩලයේ සභාපති හා සාමාජිකත්වයේ නාම ලේඛනය පහත පරිදි විය:-

| *තනතුර* | *නම* | *පත්වූ දිනය* |
|---|---|---|
| සභාපති | ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා | 2012.06.14 |
| සාමාජික | මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා | 2012.06.14 |
| සාමාජික | මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා | 2012.06.14 |
| සාමාජික | නීතිඥ චන්දන ප්‍රසාද් සූරියආරච්චි මහතා | 2012.06.14 |
| සාමාජික | ආරියනන්ද දොඹගහවත්ත මහතා | 2012.06.14 |
| සාමාජික | ප්‍රදීප විජේසුන්දර මහතා | 2011.09.05 |
| සාමාජික | කරුණාදාස සූරියආරච්චි මහතා | 2012.06.14 |

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අමාත්‍යතුමා විසින් 2012.04.02 දින මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ලෙස එම්.කේ.ඩී.එන්.මාදම්ප මහත්මිය පත් කරනු ලැබීය.

සාමාජික ප්‍රදීප විජේසුන්දර මහතාගේ නිල කාලය 2014.09.05 දිනෙන් අවසන් වූ අතර ඒ වෙනුවට සාමාජික එස්. තිලෙයිනාදන් මහතා 2014.10.21 දින පත් කරන ලදී.

**02. මණ්ඩලයේ රැස්වීම්**

සභාපතිතුමාගේ හා සාමාජික මහතුන්ගේ ප්‍රධානත්වයෙන් මණ්ඩල රැස්වීම් 25ක් 2014 වර්ෂය තුළ දී පැවැත්විණි.

**03. පැමිණිලි**

2014 වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි පිළිබඳ විභාග 61 ක් ලැබී තිබුණි.

එසේම 2012 හා 2013 වසර වලින් 2014 වර්ෂයට ඉදිරියට ගෙනෙන ලද මණ්ඩලයට ක්‍රියාමාර්ග ගැනීමට ඇති පැමිණිලි සංඛ්‍යාව පිළිවෙළින් 03ක් හා 41ක් වේ.

| | |
|---|---|
| 2012 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි ගණන | - 03 |
| 2013 වසරේ ලද පැමිණිලි සංඛ්‍යාව | - 41 |
| 2014 වසරේ ලද පැමිණිලි ගණන | - 55 |
| 2014 වසරේ විභාග කළ මුළු පැමිණිලි ගණන | 99 |

එසේ ලද පැමිණිලිවල මූලයන් පහත පරිදි බෙදා දැක්විය හැකිය :

1. පුද්ගලයන්
2. ආයතන ප්‍රධානීන් /අමාත්‍යාංශ ලේකම්වරුන්
3. ආචාර්යවරුන්
4. විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරීන්
5. පූජ්‍ය පක්ෂය

6. ගුරුමහත්ම, මහත්මීන්
7. සමිති සමාගම්

2014 වර්ෂයේ ලද පැමිණිලි 55 පහත දැක්වෙන පුවත්පත් අයිතිකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර තිබුණි.
අයිතිකරුගේ නම :

1. සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
2. සී.ස. උපාලි පුවත්පත් සමාගම
3. ලංකා මල්ටි පබ්ලිෂර් (පෞද්ගලික) සමාගම
4. සී.ස. විජය පුවත්පත් සමාගම
5. සුමති පුවත්පත් සමාගම
6. රන්දිව පුවත්පත් ආයතනය
7. රිවිර පුවත්පත් ආයතනය
8. රාවය පබ්ලිෂර් ගරන්ටි ලිමිටඩ් ආයතනය
9. ඊතලය පුවත්පත් ආයතනය
10. ලීඩර් පබ්ලිකේෂන් ආයතනය
11. සිලෝන් නිව්ස් පේපර්ස් පුද්ගලික සමාගම

සමාලෝචිත වර්ෂයට අදාළ මුළු පැමිණිලි සම්බන්ධයෙන් මණ්ඩලය තීරණ ලබා ගත් ආකාරය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| විමර්ශන කටයුතු වෙමින් පවතින | 34 |
| එකඟතාවයට පත් වූ | 18 |
| ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ | 23 |
| නිෂ්ප්‍රභ කිරීම | 19 |
| නියෝග | 05 |
| | 99 |

*ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ වර්ගීකරණය පහත සඳහන් නිර්නායකයන් මත පදනම් විය:*

- පැමිණිල්ල පුවත්පත් මණ්ඩලීය විෂය පථයට අදාළ නොවීම.
- පැමිණිලි පාර්ශවය නියමිත කාලයට අවශ්‍ය ලේඛන ඉදිරිපත් නොකිරීම.
- පැමිණිල්ල විභාගවන අතරතුර පැමිණිලි පාර්ශවය ඒ සඳහා සහභාගි නොවීම.
- පැමිණිල්ලට අදාළ පුවත්පත ඒ වන විට ප්‍රකාශයට පත් නොකිරීම.
- අදාළ පුවත්පත් වාර්තාවෙන් පැමිණිලිකරුට අගතියක් නොවීම.
- පැමිණිලිවලට අදාළව අධිකරණයේ නඩුවක් විභාගයට ගැනීම.

**පුවත්පත් ලියාපදිංචි කිරීම**

2014 වසරේ මණ්ඩලයේ ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව 226ක් වේ.

**04. කාර්ය මණ්ඩලය**

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර නව ආකෘතියට අනුව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කරමින් සිටියි.

වර්තමානයේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 16 කි.

| | | |
|---|---|---|
| 1. | එස්. ඒ. ජගත්සිරි මහතා | ගණකාධිකාරි |
| 2. | ටී. නිරෝෂණ මහතා | සහකාර කොමසාරිස් (විමර්ශන) |
| 3. | ඩී. එම්. විජේසිංහ මහතා | සහකාර කොමසාරිස් (විමර්ශන) |
| 4. | එච්. එස්. විජේරත්න මිය | ප්‍රවෘත්ති විමර්ශක |
| 5. | ඉන්ද්‍රානි මුරුගේසු මිය | භාෂා/භාෂණ පරිවර්තිකා |
| 6. | ටී. ඒ. අනෝමා ප්‍රියන්ති තිලකරත්න මිය | පරිගණක ක්‍රියාකරු |
| 7. | ටී. එන්. නිල්මිණී පීරිස් මිය | ගිණුම් සහකාර |
| 8. | කේ. ජී. එන්. එච්. පතිරත්න මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 9. | බී. එම්. පී. කේ. සිරිවර්ධන මෙනවිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 10. | එන්. ජේ. ඒ. ජේ. ජී. පෙරේරා මෙනවිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |
| 11. | ඒ. එස්. නෙරංජි මිය | කළමනාකරණ සහකාර (ලිපිකරු) |

12. කේ. එල්. චන්ද්‍රපාල මහතා — රියදුරු
13. ජී. බී. කරුණාතිලක මහතා — රියදුරු
14. කේ. ජී. එෆ්. විජේරත්න මහතා — කාර්යාල කාර්ය සහයක
15. එච්. ඒ. ටී. විජේරත්න මහතා — කාර්යාල කාර්ය සහයක
16. එච්. එස්. එස්. ආනන්ද මහතා — පණිවිඩකරු

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) කේ. ඩබ්ලිව්. ටී. එන්. අමරතුංග මහත්මිය 2014.05.09 දින සිට වැඩ බලන පුවත්පත් කොමසාරිස් තනතුරට පත් කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සහකාර කොමසාරිස් (විමර්ශන) තනතුරට සම්මුඛ පරීක්ෂණයක් මඟින් ටී. නිරෝෂණ මහතා 2014.01.24 දින සිට පත් කළ අතර 2009.09.01 සිට 2012.08.31 දක්වා ද්විතීයන පදනම මත වසර 3ක කාලයක් පත්කර තිබූ අතර එම කාලය තවත් හය මසකින් දීර්ඝ කර ඇත.

**05. අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නිකුත් කරනු ලබන විධාන**

සමාලෝචිත කාලය තුළ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නියෝග නිකුත් නොකළේ ය.

**06. මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

(1) පහත සඳහන් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු හා පාසල් මාධ්‍යවේදී වැඩමුළු 2014 වසරේ දී පවත්වන ලදී.

| දිනය | වැඩමුළුව | සහභාගී වූ මාධ්‍යවේදීන්/ පාසල් සිසුන් සංඛ්‍යාව | පැවැත් වූ ස්ථානය |
|---|---|---|---|
| 2014.01.18 | කුලියාපිටිය ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 77 | "Srimalie Earts Court Hotel-Kuliyapitiya" |
| 2014.02.11 | කුලියාපිටිය පාසල් මාධ්‍යවේදී වැඩමුළුව | 277 | කුලියාපිටිය ශාන්ත ජෝශප් මහා විද්‍යාලය |
| 2014.05.24 | නුවරඑළිය ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 70 | "Ceybank Holiday Homes (Pvt)Ltd" |
| 2014.05.29 | ඉබ්බාගමුව පාසල් මාධ්‍යවේදී වැඩමුළුව | 311 | ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය |
| 2014.06.26 | ජයවර්ධනපුර කලාපීය පාසල් මාධ්‍ය වැඩමුළුව | 208 | නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විදුහල |
| 2014.07.19 | යාපනය ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 36 | "District Secretariat Auditorium" |
| 2014.09.27 | පොළොන්නරුව ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව | 49 | "Hotel Mahanuge" |
| 2014.10.14 | හොරණ පාසල් මාධ්‍යවේදී වැඩමුළුව | 248 | හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය |

**දැයට කිරුළ වැඩසටහන**

2014.02.21 දින සිට 2014.03.01 දින දක්වා කුලියාපිටිය තාක්ෂණ විදුහල් භූමියේ දී දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය පැවැත්විණි. එහිදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයෙන් ද ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරන ලදී.

**පුවත්පත් කලාව හා ජනසන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2014 වසර**

මාධ්‍යවේදීන් 33 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීම අරමුණු කර පුවත්පත් කලාව හා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ හතරවන කණ්ඩායමේ අධ්‍යයන කටයුතු 2014.04.03 දින ආරම්භ කරන ලදී.

කාලීන වශයෙන් වැදගත් ප්‍රකාශනයන් ඉලක්ක කර සන්නිවේදන කතිකාවත නම් සාකච්ඡාමය වැඩ සටහනක් සෑම සිකුරාදා දිනකම පස්වරුවේ පවත්වන ලදී.

**08. මුදල්**

I. 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. 20,000,000/- ක මුදලක් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අනුමත කරන ලදී. මෙම මුදලින් රු. 18,270,000/-ක් මණ්ඩලයේ වියදම් සඳහා වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයෙන් මාසික වාරික වශයෙන් ලබා ගන්නා ලදී.

II. 2014 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 1,000,000/- ක මුදලක් මහා භාණ්ඩාගාරයේ වැය ශීර්ෂය යටතේ අනුමත කළ අතර මෙම මුදලින් රු. 1,000,000/- ක් මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගන්නා ලදී.

III. රජයේ දායකය සහ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු හැරුණු විට 2014 වර්ෂය තුළ දී මණ්ඩල අරමුදලට බැර කරන ලද ලැබීම් මෙසේ ය.

| | | |
|---|---|---|
| ආපසු ලැබීම්, තැන්පත් සහ වෙනත් අවකරණ | රු. | 511,797.31 |
| ප්‍රමාද ගාස්තු ආදායම් | රු. | 121,300.00 |
| | | 633,097.31 |

IV. **මූල්‍ය කාර්ය සාධන වාර්තාව**

පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ද ඇතුළුව වර්ෂය තුළ මුළු ආදායම රු. 19,500,487.65ක් වූ අතර මුළු වියදම රු. 20,991,454.55ක් විය. ආදායම් ඉක්ම වූ වියදම රු. 1,490,966.90ක් 2014 වර්ෂයේ දී මණ්ඩල අරමුදලට හර කරන ලදී.

V. **මණ්ඩල සමුච්චිත අරමුදල**

2014 වර්ෂය ආරම්භයේ දී මණ්ඩල අරමුදලේ හර ශේෂය රු. 3,625,336.30 කි. වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 10,074,500.00 කි. වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා ලද මුදල රු. 1,000,000 කි. මෙම වසරේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 2,849,514/-ක් විය. ත්‍රී රෝද රථය නැවත ප්‍රත්‍යාගණනය කිරීම නිසා ප්‍රාග්ධන සංචිත සඳහා මාරු කිරීම් රු. 56,500.00කි. වර්ෂය තුළ ආදායම ඉක්ම වූ වියදම රු. 1,490,966.90 ක් සහ කලින් වර්ෂයට ගැලපුම් වෙනුවෙන් රු. (24,973.44) ක් මණ්ඩල අරමුදලට මාරු කිරීමෙන් පසු වර්ෂය අවසානයේ මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු. 10,882,198.36 ක් විය.

මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය ද, පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කිරීම් වන රු. 4,278,570/- ක් සහ ප්‍රවර්තන බැරකම් වන රු. 174,908.36 ක් ද ඇතුළුව මුළු වගකීම් ප්‍රමාණය ස්ථාවර වත්කම් වන රු. 8,999,117.98 ක්, පාරිතෝෂික, පර්යේෂණ ණය අරමුදල් හා වෙනත් තැන්පත් රු. 3,139,173.89 ක් හා ප්‍රවර්තන වත්කම් රු. 3,197,384.65 ක් මගින් නියෝජනය වේ.

VI. **පුවත්පත් ලියාපදිංචි කිරීම**

2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 597,500/- ක් ලැබුණි.

**08. ස්තුතිය**

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු නිවැරදි උපදෙස් සහ සහයෝගය මෙන්ම වගකීම් හා යුතුකම් ඉටු කිරීමේ දී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල කාර්ය මණ්ඩලයේ සියලුදෙනා විසින් දක්වන ලද ඇප කැපවීම ද අගය කරමි.

ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න,
සභාපති.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
බොරැල්ල,
කොළඹ 08.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| (සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි) | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| **වත්කම්** | | *රු. ශත* | *රු. ශත* |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 10 | 651,864.64 | 548,010.60 |
| ලැබිය යුතු ආදායම් | 11 | 23,962.71 | 81,143.25 |
| තොග ලේඛනය | 12 | 552,229.77 | 613,630.73 |
| උත්සව අත්තිකාරම් | | 12,000.00 | 13,000.00 |
| දේශීය මිලදී ගැණුම් සඳහා අත්තිකාරම් | | 10,000.00 | – |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 13 | 696,121.73 | 712,490.07 |
| ලැබිය යුතු ආපදා ණය | 14 | 1,251,206.00 | 1,523,029.50 |
| | | **3,197,384.85** | **3,491,304.15** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ යන්ත්‍රාගාර සහ උපකරණ | 15 | 8,999,117.98 | 9,435,790.44 |
| ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් වෙනුවෙන්) | 16 | 3,139,173.89 | 2,261,573.08 |
| | | **12,138,291.87** | **11,697,363.52** |
| **මුළු වත්කම්** | | **15,335,676.72** | **15,188,667.67** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ ණයහිමියෝ | | 2,000.00 | 2,000.00 |
| උපචිත වියදම් | 17 | 172,908.36 | 106,821.97 |
| | | **174,908.36** | **108,821.97** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 18 | 4,278,570.00 | 3,738,207.00 |
| | | **4,278,570.00** | **3,738,207.00** |
| **මුළු වගකීම්** | | **4,453,478.36** | **3,847,028.97** |
| **ශුද්ධ වත්කම්** | | **10,882,198.36** | **11,341,638.70** |
| **ශුද්ධ වත්කම් / කොටස් ප්‍රාග්ධනය** | | | |
| හඳුන්වාදුන් ප්‍රාග්ධනය | | | |
| රාජ්‍ය භාණ්ඩාගාරය | | 2,849,514.00 | 10,074,500.00 |
| ප්‍රාග්ධන සංචිත | | 4,115,000.00 | 4,115,000.00 |
| ප්‍රත්‍යාගනන සංචිත | | 833,975.00 | 777,475.00 |
| සමුච්චිත අතිරික්ත / (හිඟ) | | 3,083,709.36 | (3,625,336.30) |
| | | **10,882,198.36** | **11,341,638.70** |

පිටු අංක 05 සිට 16 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

...........................
ගණකාධිකාරී
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ සියලු වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

...........................
පුවත්පත් කොමසාරිස් (*වැ.බ.*)
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2013 පෙබරවාරි 28

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

| (සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි) | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| **ආදායම** | | රු. ශත | රු. ශත |
| රජයේ ප්‍රතිපාදන | 3 | 18,270,000.00 | 18,983,750.00 |
| පොත් අලෙවියෙන් ලද කොමිස් | | - | 0.00 |
| පුවත්පත් ලියාපදිංචි ගාස්තු | | 597,500.00 | 147,200.00 |
| ඡායා පිටපත් ගාස්තු | | 6,825.00 | 4,910.00 |
| ප්‍රමාද ගාස්තු | | 121,300.00 | 89,200.00 |
| පොත් අලෙවිය | 4 | (109.66) | (1,363.74) |
| ඩිප්ලෝමා පාඨමාලා ආදායම | | 353,000.00 | 210,000.00 |
| පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය | | 57,359.17 | 62,765.65 |
| පොලී ආදායම - ඉතුරුම් ගිණුම | | 94,613.14 | 86,055.37 |
| විවිධ ආදායම් | | - | 15,472.00 |
| **මුළු ආදායම** | | **19,500,487.65** | **19,597,989.28** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 5 | 9,106,096.84 | 7,661,575.22 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 6 | 1,035,844.39 | 935,562.13 |
| දේපළ ක්ෂයවීම්, යන්ත්‍රාගාර සහ උපකරණ | | 1,427,923.77 | 1,459,343.00 |
| උපයෝගිතා වියදම් | 7 | 3,160,808.22 | 2,828,049.37 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8 | 2,114,834.66 | 2,026,326.52 |
| ප්‍රදාන සහ හුවමාරු ගෙවීම් | 9 | 4,145,946.67 | 6,474,069.45 |
| **මුළු වියදම්** | | **20,991,454.55** | **21,384,925.69** |
| **බදු පෙර අතිරික්තය/(හිඟය)** | | **(1,490.966.90)** | **(1,786,936.41)** |
| **ආදායම් බදු වියදම්** | | - | - |
| **වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)** | | **(1,490,966.90)** | **(1,786,936.41)** |

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
වත්කම් / කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගනන සංචිතය | සමුච්චිත අතිරික්ත / (හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,450,000.00** | **3,415,000.00** | **777,475.00** | **(1,759,206.90)** | **12,883,268.10** |
| **2012 වර්ෂයේදී වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම්** | | | | | |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 682,000.00 | - | - | - | 682,000.00 |
| භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | (757,500.00) | - | - | - | (757,500.00) |
| ප්‍රාග්ධන සංචිතයට මාරුකිරීම් | (700,000.00) | 700,000.00 | - | - | - |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය) | - | - | - | (79,647.99) | (79,647.99) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **9,674,500.00** | **4,115,000.00** | **777,475.00** | **(1,838,854.89)** | **12,728,120.11** |
| **2013 වර්ෂයේදී වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම්** | | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් /වැරදි නිවැරදි කිරීම් (සටහන A) | - | - | - | 455.00 | 455.00 |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 400,000.00 | - | - | - | 400,000.00 |
| භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | - | - | - | - | - |
| ප්‍රාග්ධන සංචිතයට මාරු කිරීම් | - | - | - | - | - |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය) | | | | (1,786,936.41) | (1,786,936.41) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,074,500.00** | **4,115,000.00** | **777,475.00** | **(3,625,336.30)** | **11,341,638.70** |
| **2014 වර්ෂයේදී වත්කම්/කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්කම්** | | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් /වැරදි නිවැරදි කිරීම් (සටහන B) | - | - | - | (24,973.44) | (24,973.44) |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 1,000,000.00 | - | - | - | 1,000,000.00 |
| භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | - | - | - | - | - |
| ප්‍රාග්ධන සංචිතයට මාරු කිරීම් | - | - | 56,500.00 | - | 56,500.00 |
| රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම (ක්‍රම ක්ෂය සඳහා) | (8,224,986.00) | - | - | 8,224,986.00 | - |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය) | - | - | - | (1,490,966.90) | (1,490,966.90) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,849,514.00** | **4,115,000.00** | **833,975.00** | **3,083,709.36** | **10,882,198.36** |

(සම්බන්ධයි.....)

**සටහන් A - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම්/වැරදි නිවැරදි කිරීම්**

| | රු. ශත |
|---|---|
| වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට පහත ගැලපුම් සිදු කර ඇත | |
| 2011 වසර සඳහා ඩිප්ලෝමා ලියාපදිංචි කිරීම් | 15,000.00 |
| අවලංගු කළ චෙක්පත් | 6,300.00 |
| 2011 වසර සඳහා පුවත්පත් ලියාපදිංචි කිරීම් | 7,400.00 |
| | **28,700.00** |
| 2011 ප්‍රතිපාදන යටතේ විගණන ගාස්තු | (17,153.00) |
| කුලී තැන්පතු කපා හැරීම් | (7,500.00) |
| පුවත්පත් මිලදී ගැනීම් | (1,590.00) |
| ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු ආපසු ගෙවීම් | (2,000.00) |
| බැංකු තැන්පතු වැරදි | (2.00) |
| | 455.00 |

**සටහන් B - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම්/වැරදි නිවැරදි කිරීම්**

| | |
|---|---|
| වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට පහත ගැලපුම් සිදු කර ඇත | |
| 2013 වසර සඳහා ඩිප්ලෝමා ලියාපදිංචි කිරීම | 12,000.00 |
| වැරදි නිවැරදි කිරීම් - ක්ෂය | 48,433.33 |
| පුවත්පත් විකුණුම් | 4,816.50 |
| 2013 වසර සඳහා පත්තර ලියාපදිංචි කිරීම් | 40,250.00 |
| | **105,499.83** |
| වැරදි නිවැරදි කිරීම් - ස්ථාවර වත්කම් | (44,180.00) |
| 2012 වසරේ ටෝනර් මිලදී ගැනීම් | (34,800.00) |
| වැරදි නිවැරදි කිරීම් - පොත් තොග | (15,250.00) |
| | (25,043.27) |
| වැරදි නිවැරදි කිරීම් - ක්ෂය | (1,200.00) |
| 2012; 2013 වසර සඳහා ඩිප්ලෝමා ලියාපදිංචි කිරීම් ගාස්තු ගැලපීම | (10,000.00) |
| | (24,973.44) |

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. ශත | රු.ශත |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | (1,490,967) | (1,786,936) |
| **මුදල් නොවන මෙහෙයුම් සඳහා ගැලපුම්** | | | |
| ක්ෂයවීම් | | 1,427,924 | 1,459,343 |
| කපාහැරීම් | | 35,490 | 2,691 |
| පෙර වර්ෂයේ ගැලපුම් | | (24,973) | 455 |
| ප්‍රාග්ධන සංචිතයට මාරු කිරීම් | | 56,500 | - |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 540,363 | 404,101 |
| භාණ්ඩ ලේඛනවල (වැඩිවීම්) / අඩුවීම් | | 61,401 | (159,901) |
| උත්සව අත්තිකාරම්වල (වැඩිවීම්) / අඩුවීම් | | 1,000 | 0 |
| වෙනත් ජංගම වත්කම්වල (වැඩිවීම්) / අඩුවීම් | | 57,180 | (5,632) |
| තැන්පතු සහ කලින් ගෙවීම් (වැඩිවීම්) / අඩුවීම් | | 16,368 | 1,015,172 |
| දේශීය මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් (වැඩිවීම්) / අඩුවීම් | | (10,000) | - |
| ලැබිය යුතු ආපදා ණය (වැඩිවීම්) / අඩුවීම් | | 271,824 | (11,091) |
| විවිධ ණයහිමියන්ගේ වැඩිවීම් / (අඩුවීම්) | | - | 1,500 |
| උපචිත වියදම්වල වැඩිවීම් / (අඩුවීම්) | | 66,086 | (36,382) |
| **මෙහෙයුම්වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්** | | **1,008,196** | **883,320** |
| ගෙවූ පාරිතෝෂික | | 0 | 0 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **1,008,196** | **883,320** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| මිලදී ගත් ස්ථාවර වත්කම් | | (1,026,741) | (474,635) |
| අරමුදල්වල ආයෝජන | | (877,601) | (435,280) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)** | | **(1,904,342)** | **(909,915)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන / (වෙත කරන ලද ආපසු ගෙවීම්) | | 1,000,000 | 400,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)** | | **1,000,000** | **400,000** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වර්ධනය /අඩුවීම** | | **103,854** | **373,405** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **548,011** | **174,606** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 10 | **651,865** | **548,011** |

පිටු අංක 05 සිට 13 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.

**1. සංස්ථාපනය සහ නෛතික ව්‍යුහය**

1973 අංක 5 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයෙහි සිය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය පවත්වාගෙන යනු ලබයි.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

පුවත්පත් නිදහස ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා වන සංස්කෘතිකාංගයක් ලෙස ප්‍රචලිත කිරීම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයයි.

1.2 ගිණුම් වාර්තා සැකසීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී භාවිත කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් එම ප්‍රතිපත්තීන් ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති සෑම වර්ෂයකදීම භාවිත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් ඒකාබද්ධව ප්‍රකාශයට පත්කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත.

1.4 අඛණ්ඩභාවය

මණ්ඩලයට නුදුරු අනාගතය තුළ තම මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ඇති බවට පාලක මණ්ඩලය සෑහීමකට පත්වේ. එබැවින් අඛණ්ඩභාවය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

1.1.2 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනය විසින් අඛණ්ඩව භාවිත කර ඇති අතර පෙර වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

1.1.3 යෝග්‍ය බව සහ සමූහනය

සමාන අයිතම කාණ්ඩයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති අතර අසමාන අයිතම හෝ කාර්යයන් අදාළ වේ නම් පමණක් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

1.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

**2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සෑම කාල සීමාවකටම අදාළ කර ගෙන ඇත.

2.1 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

2.1.1 හඳුනා ගැනීම සහ ප්‍රමාණනය

මෝටර් රථ හැර සියලුම යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි සඳහා වන අගයන් අඩුකිරීමෙන් පසු දක්වා ඇත. ප්‍රත්‍යාගනන දින වන විට මෝටර්රථවල සාධාරණ අගය ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවල අගයන්ට වඩා අඩු බැවින් ඒවා ප්‍රත්‍යාගනන අගයට සටහන් කර ඇත. දේපළ, යන්ත්‍ර සහ උපකරණවල පවතින අගයන් අයකරගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී ඒවා විය හැකි හානි සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මූලිකවම පිරිවැය මත වාර්තා කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවන්හි දී සම්පූර්ණ කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රත්‍යාගනනය කර ඇත. ප්‍රත්‍යාගනනයන් නිසි පරිදි කලින් කලට සිදු කර ඇත. වත්කමක් ප්‍රත්‍යාගනනය කරන අවස්ථාවේ දී පවතින අගයෙහි සිදුවන වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගනන සංචිතයට බැර කරනු ලැබේ. අදාළ වත්කමෙහි පූර්ව අතිරික්තය ඉක්මවන ප්‍රත්‍යාගනන හිඟයක් ප්‍රත්‍යාගනන සංචිතයේ අතිරික්තය ඉදිරියේ සටහන් කෙරෙන අතර ඕනෑම අතිරික්තයක් වියදමක් ලෙස හඳුනා ගැනේ. වත්කම් බැහැර කිරීමේ දී විකුණන වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගනන සංචිතයක් රඳවාගත් ඉපයුම්වලට මාරු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ උපකරණවලින් තවදුරටත් ආර්ථික වාසි බලාපොරොත්තු නොවන අවස්ථාවන්හි දී එම අයිතමයන් ප්‍රතිස්ථාපනය හෝ බැහැර කිරීම මගින් ඉවත් කරනු ලැබේ. එම වත්කම ඉවත්කිරීමෙන් ලද ලාභ හෝ පාඩු අදාළ වත්කම ඉවත් කළ වසරේ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.1.2 **ක්ෂයවීම්**

නිරවුල් ඉඩම් හැර සියලුම දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහා ඒවායේ ඇස්තමේන්තුගත සඵල ආර්ථික කාලය පුරා කපා හැරෙන ලෙසට සෘජු ක්‍රමයක් භාවිතයෙන් පිරිවැය හෝ තක්සේරුව මත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත සඵල කාලය පහත පරිදි වේ.

| *වත්කම් වර්ගය* | *වසර* |
|---|---|
| මෝටර් රථ - (10%) | 10 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් - (20%) | 05 |
| කාර්යාල සහ සුහ සාධන උපකරණ - (20%) | 05 |
| පුස්තකාල පොත් - (20%) | 05 |

වත්කම්වල සඵල කාලය සහ ශේෂ වටිනාකම සමාලෝචනය කෙරෙන අතර අවශ්‍ය නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ ගැලපුම් සිදු කෙරේ. මිළදී ගත් වර්ෂයේ දී ක්ෂය සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන වෙන් කරන අතර බැහැර කරන වර්ෂයේ දී ක්ෂය සඳහා වෙන් කිරීම් නොකෙරේ.

2.2 **මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන දෑ යන්නෙන් ඉක්මනින් මුදල් බවට පත්කළ හැකි සහ වටිනාකමේ වෙනස්වීම්වලට භාජනය වීම ඉතා අඩු එනම්, අතැති මුදල්, ඉල්ලුම් තැන්පතුව සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටිකාලීන ආයෝජන අර්ථනිරූපණය කෙරේ.

2.3 **ආයෝජන**

ආයෝජන ඉතුරුම් තැන්පතුවලින් සමන්විත වන අතර මෙම ආයෝජන පිරිවැය මත ගිණුම් තබා ඇත.

2.4 **තොග ලේඛනය**

තොග, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍යවලින් සමන්විත වේ.

2.5 **වෙනත් ලැබීම්**

වෙනත් ලැබීම් ලබාගැනීමට අපේක්ෂිත වටිනාකමට සඳහන් කර ඇත. ඩිප්ලෝමා පාඨමාලාවෙන් ලැබිය යුතු මුදල් හැර වෙනත් සියලු ලැබීම් උපචිත පදනම මත ගිණුම් තබා ඇත.

2.6 **වගකීම් සහ ප්‍රතිපාදන**

අතීත සිදුවීමක් තුළින් වර්තමාන බැඳීමක් පැනනගින අවස්ථාවල සහ එය ඉටුකිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල ගලායාමක් බලාපොරොත්තු වන අවස්ථාවල දී ශේෂ පත්‍රය තුළ වගකීම් ඇතුළත් කෙරේ. ණයහිමියාගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවා නිම කළ යුතු බැඳීම් ශේෂපත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. ශේෂපත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවා නිමකල හැකි වගකීම් ජංගම නොවන වගකීම් ලෙස සළකනු ලැබේ.

සමාගමට පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ අනුමිත වගකීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායාම පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු අවස්ථාවක දී ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදනයක් ඇතුළත් කෙරේ.

2.7 **සේවක ප්‍රතිලාභ**

2.7.1 **නිශ්චිත දායක සැලසුම්**

මණ්ඩලයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකයන් වන අතර මණ්ඩලය විසින් එම අරමුදල් සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙළින් 15% ක් සහ 3% ක් වශයෙන් දායක මුදල් ගෙවනු ලැබේ.

2.7.2 **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ලෙස ප්‍රක්ෂේපිත ඒකක හර ක්‍රමයක් මත ගණනය කරනු ලබන පාරිතෝෂික ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මණ්ඩලය විසින් ගණනය කරනු ලැබේ. ආයුගණක ලාභ හෝ පාඩු එම සැලසුමට දායකවන්නන්ගේ අපේක්ෂිත සාමාන්‍ය ඉතිරි වැඩ කාලයට එරෙහිව ආදායම හෝ වියදම ලෙස හඳුනා ගැනේ.

2.8 **මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය**

2.8.1 **ආදායම් හඳුනා ගැනීම**

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන සහ ආදායම හා ඒ වෙනුවෙන් දරනු ලැබූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය සත්‍ය ලෙසම ගණනය කළ හැකි අවස්ථාවන්හි දී එය ආදායමක් ලෙස හඳුනා ගැනේ. ආදායම ගණනය කිරීම ලැබූ හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගය, වෙළඳ වට්ටම් සහ වෙළඳ බදු මත සිදු කෙරේ.

2.8.2 **ශ්‍රී ලංකා රජයේ දායකත්වය**

ශ්‍රී ලංකා රජයේ දායකත්වය උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.8.3 **පොලී ආදායම**

පොලී ආදායම ලාභයේ දී හෝ පාඩුවේ දී උපචිත වන විට ඵලදායී පොලී ක්‍රමය මගින් හඳුනා ගැනීම සිදු කෙරේ.

2.8.4 **වෙනත් ආදායම්**
වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.8.5.1 **වියදම් හඳුනා ගැනීම**
මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.8.5.2 **වියදම් වර්ගීකරණය**
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී වියදමෙහි ස්වභාවය මත කරන වර්ගීකරණය මගින් මණ්ඩලයෙහි කාර්යසාධන මූලිකාංග වඩා හොඳින් ඉදිරිපත් වන්නේ යැයි පාලක මණ්ඩලය අදහස් කළ හෙයින් එම ක්‍රමය භාවිත කරන ලදී.

2.9 **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේ දී 'වක්‍ර ක්‍රමය' භාවිත කර ඇත.

2.10 **වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්**
වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම් යනු වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලැබෙන දිනයත් අතර සිදුවන යහපත් හෝ අයහපත් සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයට පසු සිදුවූ සිදුවීම්වල උචිත බව සලකා බලා අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. ශත | රු.ශත |
| **සටහන 3 - ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වය** | | |
| ශ්‍රී ලංකා රජයෙන් උපයෝගීතා සහ නඩත්තු සඳහා ලද ප්‍රතිපාදන නියෝජනය වේ. | | |
| **සටහන 4 - පොත් අලෙවිය** | | |
| පොත් විකුණුම් | 30,305.00 | 34,925.00 |
| අඩු කළා - ලැබිය යුතු ආදයම් ගැලපීම | 7,505.00 | - |
| අඩු කළා - පොත් විකුණුම් පිරිවැය | 22,909.66 | 36,288.74 |
| | **(109.66)** | **(1,363.74)** |
| **සටහන 5 - වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ** | | |
| වැටුප් සහ වේතන | 6,053,177.46 | 5,076,831.55 |
| සේ.අ. අරමුදලේ දායකත්වය | 728,608.82 | 578,066.00 |
| සේ.භා. අරමුදල් දායකත්වය | 145,721.75 | 115,613.16 |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 495,614.31 | 479,658.51 |
| සාමාජික මුදල් | 552,000.00 | 504,000.00 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 540,363.00 | 404,101.00 |
| විගණන කමිටු රැස්වීම් ගාස්තු | 60,000.00 | 28,000.00 |
| වෙනත් දීමනා | 530,611.50 | 475,305.00 |
| | **9,106,096.84** | **7,661,575.22** |
| **සටහන 6 - සැපයුම් සහ අවශ්‍යතා** | | |
| ලිපිද්‍රව්‍ය | 150,338.19 | 96,502.63 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 604,491.10 | 551,325.00 |
| ඉන්ධන දීමනාව | 240,000.00 | 240,000.00 |
| කාර්යාල අවශ්‍යතා | 11,715.10 | 18,987.50 |
| වෛද්‍ය සැපයීම් | - | 255.00 |
| නිල ඇඳුම් | 16,000.00 | 19,312.00 |
| පුවත්පත් සහ වාර සඟරා | 13,300.00 | 9,180.00 |
| | **1,035,844.39** | **935,562.13** |
| **සටහන 7 - උපයෝගීතා වියදම්** | | |
| දුරකථන ගාස්තු | 267,800.31 | 219,028.80 |
| තැපැල් | 45,310,00 | 25,185.00 |
| විදුලිය | 248,912.75 | 232,695.26 |
| කාර්යාල කුලී | 2,160,000.00 | 1,920,000.00 |
| ජල ගාස්තු | 58,289.27 | 49,599.10 |
| ආරක්ෂක වියදම් | 380,495.89 | 381,541.21 |
| | **3,160,808.22** | **2,828,049.37** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. ශත | රු.ශත |
| **සටහන 8 - වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| ප්‍රවාහන | - | - |
| ප්‍රවාහන දීමනා | 360,000.00 | 360,000.00 |
| ගමන් වියදම් - නිලධාරි | 44,042.00 | 44,217.00 |
| ගමන් වියදම් - සාමාජික | 92,950.00 | 85,397.00 |
| ගමන් වියදම් - විදේශීය | 141,807.25 | - |
| දැන්වීම් සහ ප්‍රකාශන | 133,775.60 | 186,588.80 |
| මුද්‍රණ සහ පොත් බැඳීම් | 132,537.00 | 152,926.00 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 711,185.96 | 721,422.32 |
| සංග්‍රහ වියදම් | 178,161.00 | 153,510.00 |
| කාර්යාල සහ ආගමික උත්සව වියදම් | 56,316.00 | 1,629.00 |
| කාර්යාල ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් කපාහැරීම් | - | 2,690.75 |
| විගණන ගාස්තු | 39,648.00 | 39,648.00 |
| අනියම් වියදම් | 12,086.00 | 22,839.50 |
| බැංකු ගාස්තු | 7,039.30 | 12,856.50 |
| මෝටර් රථ රක්ෂණ සහ බලපත්‍ර | 183,686.55 | 150,301.65 |
| නීති ගාස්තු | 21,600.00 | 0.00 |
| වෙබ්අඩවි වියදම් | - | 90,800.00 |
| ආධාර | - | 1,500.00 |
| | **2,114,834.66** | **2,026,326.52** |
| | | |
| **සටහන 9 - ප්‍රදාන සහ මාරු කිරීම්** | | |
| පළාත් සන්නිවේදන වැඩමුළුව | 1,607,661.33 | 1,439,567.00 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 457,192.53 | 466,554.24 |
| දැයට කිරුළ වැඩසටහන | 1,734,092.81 | 1,828,138.40 |
| ප්‍රකාශන | 347,000.00 | 553,200.00 |
| පුහුණු පාඨමාලාව - නිලධාරි | - | 17,500.00 |
| ජනමාධ්‍ය සමුළුව - 4 වන සංවත්සරය | - | 2,169,109.81 |
| | **4,145,946.67** | **6,474,069.45** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. ශත | රු.ශත |
| **සටහන 10 - මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ මුදල් | 651,864.64 | 548,010.60 |
| | **651,864.64** | **548,010.60** |
| **සටහන 11 - වෙනත් ජංගම වත්කම්** | | |
| ලංකා පුවත් සමාගම - අළුත්වැඩියා ගාස්තු | 13,497.25 | 0.00 |
| අයවිය යුතු වේතන | 2,095.46 | 8,268.25 |
| ලියාපදිංචි සහ ප්‍රමාද ගාස්තු | 2,000.00 | 59,000.00 |
| පොත් අලෙවිය | 6,370.00 | 13,875.00 |
| | **23,962.71** | **81,143.25** |
| **සටහන 12 - තොග ලේඛනය** | | |
| පොත් තොග | 381,880.01 | 530,667.65 |
| ලිපිද්‍රව්‍ය තොග | 105,863.36 | 82,963.08 |
| විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ තොග | 64,486.40 | - |
| | **552,229.77** | **613,630.73** |
| **සටහන 13 - තැන්පතු සහ අත්තිකාරම්** | | |
| ආරක්ෂක තැන්පතුව - කාසල් වීදිය ගොඩනැගිල්ල | 540,000.00 | 480,000.00 |
| ආරක්ෂක තැන්පතුව - ජල බෝතල් | 4,000.00 | 4,000.00 |
| ඉන්ධන තැන්පතුව | 75,000.00 | 75,000.00 |
| රක්ෂණ සහ ආදායම් සහතික ගාස්තු | 77,121.73 | 153,490.07 |
| **එකතුව** | **696,121.73** | **712,490.07** |
| **සටහන 14 - ලැබිය යුතු ආපදා ණය** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,523,029.50 | 1,511,938.50 |
| වර්ෂය තුළ ලබා දුන් ණය | 99,920.00 | 546,705.75 |
| | **1,622,949.50** | **2,058,644.25** |
| වර්ෂය තුළ අයකර ගත් ණය | (371,743.50) | (535,614.75) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **1,251,206.00** | **1,523,029.50** |

**සටහන 15 - දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ**

| | මෝටර් රථ | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | කාර්යාල සහ සුහසාධන උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| **පිරිවැය / ප්‍රත්‍යාගණනය** | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | **10,102,680.00** | **1,235,862.75** | **2,002,656.83** | **178,344.48** | **13,519,544.06** |
| එකතු කිරීම් | 96,000.00 | 25,656.25 | 903,585.00 | 1,500.00 | **1,026,741.25** |
| බැහැර කිරීම් / කපා හැරීම් | (197,680.00) | - | - | - | **(197,680.00)** |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,001,000.00** | **1,261,519.00** | **2,906,241.83** | **179,844.48** | **14,348,605.31** |
| **ක්ෂයවීම්** | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | **1,958,000.00** | **1,150,552.00** | **922,285.00** | **52,916.62** | **4,083,753.62** |
| එකතු කිරීම් | - | - | 267,238.00 | 25,043.27 | 292,281.27 |
| වර්ෂය සඳහා | 920,000.00 | 140,226.00 | 341,594.50 | 26,103.27 | 1,427,923.77 |
| බැහැර කිරීම් මත | (140,000.00) | (269,638.00) | (44,833.33) | 0.00 | (454,471.33) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,738,000.00** | **1,021,140.00** | **1,486,284.17** | **104,063.16** | **5,349,487.33** |
| **පවතින වටිනාකම** | | | | | |
| **2013 දෙසැම්බර් 31 දිනට** | **8,144,680.00** | **85,310.75** | **1,080,371.83** | **125,427.86** | **9,435,790.44** |
| **2014 දෙසැම්බර් 31 දිනට** | **7,263,000.00** | **240,379.00** | **1,419,957.66** | **75,781.32** | **8,999,117.98** |

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| **සටහන 16 - ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් සඳහා)** | | |
| මහජන බැංකුව - ණය අරමුදල | 1,250,203.76 | 824,704.55 |
| මහජන බැංකුව - පර්යේෂණ අරමුදල | 1,212,556.69 | 786,934.31 |
| මහජන බැංකුව - පාරිතෝෂික අරමුදල | 676,413.44 | 649,934.22 |
| | **3,139,173.89** | **2,261,573.08** |
| **සටහන 17 - උපචිත වියදම්** | | |
| අතිකාල | 46,219.06 | 30,427.13 |
| ගමන් වියදම් දීමනා | 400.00 | 1,600.00 |
| දුරකථන | 18,973.30 | 4,206.84 |
| විගණන ගාස්තු | 106,176.00 | 66,528,00 |
| කාර්යාල උපකරණ නඩත්තු | - | 4,060.00 |
| අවිනිශ්චිත බැරකම් | 1,140.00 | 0.00 |
| | **172,908.36** | **106,821.97** |
| **සටහන 18 - සේවක ප්‍රතිලාභ** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 3,738,207.00 | 3,334,106.00 |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික | | - |
| | **3,738,207.00** | **3,334,106.00** |
| වර්ෂය තුළ වෙන් කිරීම් / (ඉවත් කිරීම්) | 540,363.00 | 404,101.00 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **4,278,570.00** | **3,738,207.00** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | ටීඑම්-1/එෆ්/එස්එල්පීසී/1/14/27 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2015 ජූලි 17 දින |

සභාපති,
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2015 ජුනි 05 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. +94 (0) 112887028 - 34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. +94 (0) 112887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09**

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගය මත වාර්තා කළ යුතු වුව ද, මණ්ඩලයේ යල් පැනීමට ලක්වූ සහ පිරිවැය නැවත සම්පූර්ණයෙන් අයකර ගැනීමට නොහැකි තත්ත්වයේ පවතින පොත්පත් ඒවායේ පිරිවැය වූ රු. 381,880 වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07**

ස්ථාවර වත්කම් හි සුන්බුන් වටිනාකම හා ඵලදයී ජීවකාලය වෙළෙඳපළ තොරතුරු මත තීරණය කළ යුතු වුවද වත්කම් අත්පත් කර ගන්නා විට ඒවායේ සුන්බුන් අගය හා ඵලදයී ජීවිත කාලය ගණකාධිකාරීවරයාගේ ඇස්තමේන්තු මත අගය කර තිබුණු අතර වාර්ෂිකව වත්කම් ඇගයීමකට ලක් කර ද නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**

මුදල් ගලා ඒම් හා ගලායාම් පිළිඹිබු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කළ යුතු වුවත් පහත දැක්වෙන අවස්ථාවන්හි ඊට පටහැනි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කොට තිබුණි.

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන ගැලපීම් යටතේ කපාහැරීම් ලෙස රු. 35,490ක වටිනාකමක් දක්වා තිබූ අතර එවැනි කපාහැරීමක් මූල්‍ය කාර්යසාධන වාර්තාවෙහි ඇතුළත් කොට නොතිබුණි,

(ii) මෝටර් රථ ප්‍රත්‍යාගණනය හේතුවෙන් ත්‍රිරෝද රථයේ වටිනාකම රු. 26,000කින් වැඩිවීම හා මණ්ඩලය පවත්වාගෙන ගිය අරමුදල් ගිණුම් සඳහා සමාලෝචිත වර්ෂයේ ලද පොළී මුදල වන රු. 94,613ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් හේතුවෙන් පිටතට ගලාගිය මුදල් ප්‍රවාහයක් ලෙස හඳුනාගෙන තිබුණි.

2.2.2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව, වත්කම් භාවිතයට ගත් දින සිට ක්ෂය ගණනය කිරීමේ පදනම ලෙසට වෙනස් කොට තිබුණ ද අවසන් ගිණුම් හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ ක්ෂය ප්‍රතිපත්ති ඒ අනුව හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ දයකය ගිණුම් තැබීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මණ්ඩලය විසින් අනුගමනය කර නොතිබුණි.

2.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු විෂයයන් 03කට අදළ සන්සන්දනාත්මක තොරතුරු රු. 8,268කින් වෙනස් කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම රු. 136,152ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසිවලට සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ :

| **නීති රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2010 මැයි 14 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ සීඒ/1/17/1 ලිපියේ 1 ඡේදය | අමාත්‍යාංශ සහ ඒ යටතේ පවත්නා සියලුම ආයතනයන් හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හා රාජ්‍ය ආයතනයන්ට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යායුතු බවට කරන ලද දැනුවත් කිරීම සහ, 2012 ජූලි 10 දින පැවැති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග අංක 7 අනුව මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රය රජයේ ගොඩනැගිල්ලක් වෙත ගෙන යැමට කරන ලද නියෝගය අනුව කටයුතු කර නොතිබුණි. එසේම ආයතනය ආරම්භ වී වසර 40ක් ඉක්මවා තිබුණ ද, විවිධ ස්ථානවල කුලී පදනම මත කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. 2006 සිට 2014 වර්ෂය දක්වා පමණක් කුලී වශයෙන් රු. 11,570,500ක් වැය කර තිබුණි. තව ද 2014 වර්ෂයේ යාවත්කාලීන කරන ලද කුලී ගිවිසුම අනුව මාසික කුලිය රු. 20,000කින් ඉහළ දමා තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | කාර්තුමය කාර්ය සාධන වාර්තා අදළ කාර්තුව අවසන් වී දින 30ක් ගතවීමට පෙර අදළ රේඛීය අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කළ යුතු වුව ද 2014 වර්ෂයේ සියලු කාර්තුමය වාර්තා නියමිත කාලය තුළ අදළ රේඛීය අමාත්‍යාංශ වෙත යවා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි අංක 880 | රජයේ මුදල් භාර ගැනීම හෝ භාරව සිටින නිලධාරීන්, රජයේ ගිණුමට අදළ වවුචර සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන්, ඇප ආඥපනතට අනුකූලව ඇප තැබිය යුතු බව දක්වා ඇතත් මණ්ඩලය තුළ එවැනි රාජකාරීන්හි නියුතු කිසිවකුගෙන් මෙතෙක් ඇප ලබාගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි අංක 102 හා 108 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගත වූ හෝ පාවිච්චි කළ නොහැකි අයිතමයන් හතරක් හඳුනාගෙන ඇතත් ඒ සම්බන්ධව අදළ පරිදි ක්‍රියා කොට නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි අංක 245 | ආයතනයේ වවුචර සහතික කිරීමේ දී, සහතික කරන නිලධාරියා විසින් සියලු ගෙවීම් වවුචර් සහතික කළ යුතු වුව ද ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී ගෙවීම් සහතික කිරීම සඳහා බලය පැවරීමකින් තොරව සහකාර කොමසාරිස්වරයා විසින් ගෙවීම් වවුචර සහතික කර තිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (අ) සහ (ආ) ඡේදය | ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යාම රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වගකීම දුර්වල කරන හෙයින් අමාත්‍යාංශ යටතේ පවතින සියලු ව්‍යවස්ථාපිත අරමුදල් අහෝසි කොට ඒවායේ ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුව ද රු. 3,139,174ක වටිනාකමින් යුතු අරමුදල් ගිණුම් තුනක් 2014 දෙසැම්බර් 31 දින වන විට ද මණ්ඩලය සතුව පැවතිණි. තව ද මේ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 1,490,967ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,795,205ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 304,238ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදානයන් පසුගිය වසරට වඩා රු. 713,750කින් අඩු වුව ද මණ්ඩලයේ අනෙකුත් ආදායම් ර. 616,248කින් වැඩිවීම හා පුනරාවර්තන වියදම් රු. 401,740කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි 55ක් ලැබී තිබුණු අතර 2013 වර්ෂයේ නොවිසඳී තිබූ පැමිණිලි 44ක්ද සමඟ විසඳීමට තිබුණු පැමිණිලි සංඛ්‍යාව 99ක් විය. ඉන් පැමිණිලි 34ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද විසඳා නොතිබුණි. තව ද, ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කයන් අනුව පැමිණිලි විසඳීමේ ප්‍රගතිය සියයට 55ක ප්‍රතිශතයක් පමණක් වුව ද මේ සඳහා ප්‍රතිපාදනය කර තිබුණු රු. මිලියන 2ක සම්පූර්ණ මුදලම වැය කර තිබුණි.

(ආ) වෙබ් අඩවි 60ක් ලියාපදිංචි කිරීමට වැඩසටහනක් සැලසුම් කොට තිබුණු අතර 2015 මාර්තු මාසය දක්වාම මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, දිස්ත්‍රික් ප්‍රාදේශීය මාධ්‍යවේදී හා පාසල් ජනමාධ්‍යවේදී වැඩමුළු 13ක් පැවැත්වීම ඉලක්ක කොට ගෙන රු. 1,500,000ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එසේ වුවත්, වැඩසටහන් 8ක් පමණක් පවත්වා ඒ සඳහා රු. 1,607,661ක් වැය කොට තිබුණි.

(ඈ) වඩා උසස් වෘත්තීය ජනමාධ්‍යවේදයක් ඇති කිරීම සඳහා සන්නිවේදන ග්‍රන්ථ විවිධාංග 05ක් මුද්‍රණය කිරීමට හා විෂයානුබද්ධ සංකථනයක් පැවැත්වීමට කටයුතු යොදා තිබුණ ද එය ඉටු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) පුවත්පත් මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ජනසන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලා හතරක් පවත්වා තිබුණු අතර ඒ ආශ්‍රිතව පහත කළමනාකරණ දුර්වලතාවයන් දක්නට ලැබුණි.

(i) පාඨමාලා හතර සඳහා දරන ලද මුළු වියදම 2015 මාර්තු 31 දින දක්වා රු. 2,827,501ක් වූ අතර පාඨමාලාව සඳහා අයකර තිබුණු මුළු ගාස්තු ප්‍රමාණය රු. 1,130,000ක් වූයෙන් මණ්ඩලයේ අරමුදලින් රු. 1,697,501ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. ඒ අනුව 2012 නොවැම්බර් 05 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී දුන් උපදෙස් අනුව පාඨමාලා වියදම් පියවා ගැනීමට හැකිවන පරිදි ගාස්තු සංශෝධනය කර තිබුණ ද එයින් පාඨමාලා සඳහා යන වියදම ආවරණය වී නොතිබුණි.

(ii) පසුගිය වසර හතරක කාලය තුළ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් පාඨමාලාව හැරයාමේ ප්‍රතිශතය සියයට 50ක් පමණ විය. මෙසේ පාඨමාලාව හැරයාමේ ප්‍රතිශතය වැඩිවීමට හේතුව කුමක් ද යන්න පිළිබඳව පසු විපරම් කොට ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පාඨමාලා සංවිධායකයින් විසින් කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ මාධ්‍යවේදී වැඩමුළු හා පාසැල් ජනමාධ්‍ය වැඩමුළු 8න් 3ක්ම කුරුණෑගල දිස්ත්‍රික්කය ආවරණයවන පරිදි පවත්වා තිබුණි. මීට පෙර වර්ෂයන්හිදී ද වැඩමුළු සඳහා දිස්ත්‍රික් තෝරා ගැනීමේ දී මෙවැනි අසමතුලිත තත්ත්වයක් නිරීක්ෂණය වූයෙන් වැඩමුළු පැවැත්වීමේ දී ලියාපදිංචි පාසල් ජනමාධ්‍ය සංගම් ඇති අනෙකුත් පාසැල් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් ජනමාධ්‍යය සම්බන්ධ පොත්පත් මුද්‍රණය කර අලෙවි කරනු ලබන අතර, පිරිවැය රු. 381,880ක් වූ පොත් තොගයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද මණ්ඩලය තුළ විය. මේ අතුරින් පිරිවැය රු. 84,216ක් වූ පොත් 1318 මුද්‍රණයෙන් වසර 14ක් ඉක්මවා ගොස් තිබුණු අතර පිරිවැය රු. 64,486ක් වූ පොත් 480ක් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත සියයට 30 සිට සියයට 45 දක්වා වූ ඉහළ මට්ටමකට යටත්ව පොත්හල් වෙත නිකුත් කර තිබුණි. නිශ්චිත අවශ්‍යතාවය හෝ අලෙවි කිරීමේ හැකියාව හඳුනානොගෙන පොත් මුද්‍රණය කිරීම හා මුද්‍රිත පොත්පත් අලෙවි කිරීමට හා බෙදා හැරීමට නිසි වැඩපිළිවෙළක් නොවීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) 1993 වර්ෂයේ දී ආරම්භකොට තිබූ පර්යේෂණ අරමුදල් ගිණුමේ අරමුණුවලට අනුව ග්‍රාහක සමීක්ෂණ සඳහා වූ සම්පූර්ණ වැය දැරීම් අරමුදල මගින් කළ යුතු වුව ද සමීක්ෂණ වියදම් පුනරාවර්තන ප්‍රදානයන් උපයෝගී කරගෙන කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා වැය කර තිබුණු මුදල රු. 375,000ක් වූ අතර එම ගෙවීම් සඳහා ප්‍රමාණවත් අරමුදලක් මෙම ගිණුමේ තිබුණි.

(ආ) 2014 වර්ෂයේ පැවැත්වූ සියලු වැඩමුළු සඳහා නිලධාරීන් 1000 දෙනකු වෙනුවෙන් සංග්‍රහ කටයුතු සඳහා රු. 403,392 වැය කර තිබුණි. කෙසේ වුව ද, මෙම වැඩමුළු සඳහා සහභාගී වූ පිරිස් 679 දෙනෙකු පමණක් බව වාර්තා අනුව අනාවරණය වූ බැවින් රු. 129,489 වැය කිරීම විගණනයේ දී ප්‍රශ්නකාරී වේ.

### 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

මාතලේ දිස්ත්‍රික් මාධ්‍යවේදී වැඩමුළුවක් පැවැත්වීම අරමුණුකොට ගෙන එහි පූර්ව සංවිධාන කටයුතු වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 13,475ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී වැය දරා තිබුණි. එසේ වුව ද මේ දක්වා එවැනි වැඩමුළුවක් පවත්වා නොතිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ :

(අ) පුවත්පත් මණ්ඩල පනතේ 22 වගන්තිය ප්‍රකාරව එහි විධායක නිලධාරියා වූ පුවත්පත් කොමසාරිස් තනතුරේ කටයුතු 2010 මාර්තු 31 දින සිට අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව වරින් වර අමාත්‍යාංශයේ නිර්දේශ මත පත් කරනු ලැබූ නිලධාරීන් විසින් වැඩ බැලීමේ පදනම මත ආවරණය කර තිබුණි. පූර්ණ කාලීන නිලධාරියෙකු පත් කළ යුතු මෙම

තනතුර සඳහා ස්ථිරව පුද්ගලයකු පත් කිරීම සඳහා 2012 හා 2014 වර්ෂයන්හි දී පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ද නියම කරනු ලැබුව ද මෙම වාර්තාවේ දිනය දක්වාම මෙම තනතුර සඳහා ස්ථිර පුද්ගලයෙකු බඳවා ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ පුරප්පාඩුව පැවති තනතුරු 09ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට රු. 102,144ක් වැය දරා 2013 ඔක්තෝබර් 05 දින පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි. එම පුරප්පාඩු සඳහා අයදුම්පත් ලැබී තිබුණු නමුත් තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන් දෛනික ගෙවීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දී වැටුප් වශයෙන් රු. 187,000ක් ගෙවා තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2015 මැයි 18 දින දීය.

5.2 **සංයුක්ත සැලැස්ම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2010-2014 කාල පරිච්ඡේදය දක්වා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණ ද, මේ දක්වා එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. තව ද සංයුක්ත සැලැස්මෙහි සඳහන් වූ ඇතැම් ඉලක්කයන් වර්ෂ පහ අවසන් වන විට ද ඉටු කර ගැනීමට මණ්ඩලය අපොහොසත්ව තිබුණි.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

2014 වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. තව ද 2014 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කළ කාර්ය සාධන වාර්තාව අනුව එහි සඳහන් ඉලක්කයන් ඉටු කිරීමේ භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතිණි.

5.4 **අභ්‍යන්තර විගණනය**

මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.5 **විගණන කමිටු**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් කාර්තුවකට එක බැගින් විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි.

5.6 **ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08 හි 4.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා 2014 පෙබරවාරි 20 දින සකස් කර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන තිබුණු අතර එය අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2014 අගෝස්තු මස 01 දින දීය. එම ප්‍රසම්පාදන සැලැස්ම තුළ පහත අඩුපාඩු දක්නට තිබුණි.

(i) ඒ ඒ කාලයන් හි මිලදී ගැනීමට අදහස් කරන අයිතම ප්‍රමාණය හා පිරිවැය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබීම.

(ii) එක් එක් අයිතමයේ අවශ්‍යතාවය මත මිලදීගැනීම ආරම්භ කරන දිනය හා අවසන් කිරීමට අපේක්ෂා කරන දිනයක් ඇතුළත් කර නොතිබුණි.

5.7 **අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5.8 **නොවිසඳී ඇති විගණන ඡේද**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සම්බන්ධයෙන් 2014 ජූලි 24 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නියෝග එනම් 2010 - 2014 වර්ෂයන් සඳහා වූ සංයුක්ත සැලැස්ම කාලානුරූපීව යාවත්කාලීන කිරීම, අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම හා විගණනය වෙත වාර්තා ඉදිරිපත් කිරීම, විධිමත් පරිදි විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, මණ්ඩලයේ ඉහළ ස්ථරයන්හි පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා පුද්ගලයින් පත් කිරීම, හා ලියාපදිංචි නොකළ පුවත්පත් හා සඟරා ලියාපදිංචිය සඳහා විධිමත් යාන්ත්‍රණයක් පිළියෙළ කිරීම, ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

5.9 **පාරිසරික හා සමාජ වගකීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනතේ 15 වන වගන්තිය හා 30(1) වගන්තීන් ප්‍රකාරව පුවත්පත්වල පළවන අසභ්‍ය, අපකීර්තිමත් හා සදාචාරාත්මක නොවන ප්‍රකාශන සම්බන්ධව සොයා බලා වරදකරුවන් අධිකරණය වෙත යොමු කිරීම සඳහා මණ්ඩලය තුළ පවත්නා යාන්ත්‍රණය ප්‍රමාණවත් වී නොතිබුණු අතර එවැනි සඟරා ලියාපදිංචි සඟරා ලෙස අලෙවි කළ අවස්ථා මණ්ඩලය වෙත වාර්තා වී තිබුණ ද, මණ්ඩලය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 25 වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු වුවත් එලෙස ලියාපදිංචි නොවී වෙළඳපළට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව මණ්ඩලයේ කටයුතුවලට බලපාන කරුණක් සේ සලකා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පනතේ 30වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණ ද, මේ සඳහා විධිමත් යාන්ත්‍රණයක් මේ වන තෙක් පිළියෙළ කොට නොතිබුණි.

(ඇ) දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණු අතර, මණ්ඩලයේ විමර්ශන නිලධාරිනිය විසින් ඉදිරිපත් කළ විමර්ශන වාර්තා ප්‍රමාණය 2013 වසරේ 8ක් වුව ද 2014 වර්ෂයේ දී එය 3 දක්වා පහළ බැස තිබුණි. ඒ අනුව ආචාරධර්ම පිළිපැදීම සම්බන්ධයෙන් ඇගයීම සඳහා මණ්ඩලයේ ද ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) මණ්ඩල පනතේ 15 වන වගන්තිය හා අචාරධර්ම සංග්‍රහයේ 6 වගන්තිය උල්ලංඝණය වන පරිදි අපරාධ පමණක් වාර්තා කරන පුවත්පත් ලියාපදිංචිය සඳහා කිසිදු පදනමකින් තොරව මණ්ඩලය අවසර දී තිබුණි.

5.6 **පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනයන්,
(ආ) ලේඛන නඩත්තුව,
(ඇ) පාඨමාලා පැවැත්වීම.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
විගණකාධිපති *(වැඩ බලන)*